සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

# පිළිතුරු පත්‍රය
# Marking Scheme

ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: සිංහල සාහිත්‍ය රසාස්වාදය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II

## I කොටස

(01) (i) (අ) මදු රජ්ජුරුවෝ / පබාවතීගේ පියා
(ආ) කුස රජතුමා / අතවැසියා

(ii) (අ) උතුර දකුණ මිනිසුන්ගේ එකතුවීම
(ආ) සාගර පලන්සූරිය මහතා

(iii) (අ) නංගීට
(ආ) ජී.බී.සේනානායක මහතා

(iv) (අ) රුදුරු නුහුසුවන්ගේ වල්ගෙයි විසය
නපුරු දුදනන්ගෙ සියල’ඟෙහිම විසය
(ආ) සුභාෂිතය

(v) (අ) තුම්මංහන්දිය
(ආ) මනෝ මන්දිර
ප්‍රබුද්ධ, සක්වාලිහිණි (ලකුණු 04 x 5 = 20)

(02) (i) වන්නි ප්‍රදේශයේ ගොවියෙකුගේ ජීවිතය ඇසුරින් ගත් අත්දැකීමක්
(ii) සුන්දරහාමි පිළිබඳව සත්‍ය ස්වභාවෝක්තියෙන් ප්‍රකාශ වීම, පරිසරයට ගැළපෙන අයුරින් වීම
(iii) කවියාගේ ම අත්දැකීමක් ප්‍රකාශ වීම නිසා නිර්මාණය සාර්ථක වී ඇති බව
(iv) භාෂාව, යථාස්වභාවය, සිව්පද ආකෘතිය ගැළපෙන ආකාරයට රචනා කිරීම
(v) උත්තම පුරුෂ දෘෂ්ටි කෝණයෙන් රචනා වීම, කවි පෙළේ සැබෑ යාථාර්ථය ඉස්මතුවීමකි.
ඉහත කරුණු තවදුරටත් විග්‍රහ කර තිබීම අනුව ලකුණු ලබාදෙන්න. (ලකුණු 25)

## II කොටස

(03) (i) කුස පබාවතිය ලබා ගැනීමට, ඇයට ආදරයෙන් ඕනෑම දෙයක් ඉවසාගෙන සිටින කෙනෙක් ලෙස
(ii) සිසුන් ලබාදෙන පිළිතුර බලා ලකුණු දෙන්න.
(iii) සරල, සජීවී ලෙස නිරූපණය වීම, සංවාදශීලී වීම
(iv) සීල් බත් කමින්, ඔරුව පිට සයනය කෙරමින්.... සංවාදශීලී බස පිළිබඳව ආදිය ඇසුරින් ලබාදෙන පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

නැතහොත්

(i) අලුත විවාහ වූ මනාලියකගේ හැසිරීම
(ii) භාෂාව සරල වීම, යථාස්වභාවය ව්‍යවහාර භාෂාවෙන් ප්‍රකාශ වීම, හැඟීම් ප්‍රකාශ වීම.

(iii) නිසඳැස් ආකෘතිය, විරාමයෙන් විරාමය කවිය ගලා ගිය ආකාරය අර්ථවත් වීම. කවියාගේ අත්දැකීම් ප්‍රකාශ වීම උචිත පරිදි සිදුවී ඇත.

(iv) සඳැස් ආකෘතිය අතහැර නිසඳැස් නිදහස් කවි රචකයෙකු ලෙස පාඨකයාට සමීප අත්දැකීමක් ප්‍රකාශ කිරීම, ගැළපෙන භාෂාව චිත්ත රූප මවමින් රචනා කිරීම, ව්‍යවහාර වචන භාවිතය. සාර්ථක බව

(ලකුණු 25)

## III කොටස

(04) (05) (06) (07) ප්‍රශ්න සඳහා අදාළ පාඩම් ඇසුරින් ලබාදෙන පිළිතුරු අනුව ලකුණු ලබාදෙන්න. නිදසුන් තුනක්වත් දැක්වීම අනිවාර්ය වේ.